සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා චක්‍රලේඛ ලිපි අංක **21/2020**

මගේ අංකය :- PPSC/ES/04/FI/12/2/2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නව නගරය, රත්නපුර.
2020.10. 0[illegible]

සබරගමුව පළාත් සභාවේ,

01. ප්‍රධාන ලේකම්
02. ආණ්ඩුකාරවර ලේකම්
03. සභා ලේකම්, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
04. සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්/ කොමසාරිස්වරුන්
05. පළාත් පාලන ආයතන ලේකම්වරුන් සහ අනෙකුත් දෙපාර්තුමේන්තු ප්‍රධානීන්

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙන් ස්ථිර මුදාහැරීම්, තාවකාලික මුදාහැරීම්, ඉල්ලා අස්වීම් වලට අදාළ ලිපි ලේඛන ලැබීම ප්‍රමාද වීම සම්බන්ධවයි</u>**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් අදාළ තනතුරුවලින් ස්ථිරව මුදාහැරීම්, තාවකාලික මුදාහැරීම්, ඉල්ලා අස්වීම් ආදිය සඳහා කටයුතු කිරීමට අවශ්‍ය ලිපි ලේඛන මෙම කාර්යාලයට ලැබෙන්නේ ඉතා ප්‍රමාද වීමෙනි. ඇතැම් මුදාහැරීම් ලිපි වසර ගණනාවක් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් කොමිෂන් සභාව තීරණ ගැනීමේදී යම් අපහසුතාවයන්ට පත්වන අවස්ථා තිබේ.

02 එහෙයින් මින් ඉදිරියට එලෙස සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් තනතුරුවලින් ස්ථිරව මුදාහැරීම්, තාවකාලික මුදාහැරීම්, ඉල්ලා අස්වීම් වලට අදාළ ලිපි යොමුකිරීමේදී ලිත් මසක් ඇතුලත එම ලිපිලේඛන අදාළ දෙපාර්තුමේන්තු ප්‍රධානියාගේ, විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව කොමිෂන් සභාව වෙත යොමු කිරීමට සටහන් කර ගන්නා ලෙස ද නිලධාරීන් මුදාහැරීමේදී මෙම කාර්යාලය විසින් හඳුන්වා දී ඇති ආකෘතිපත්‍රය විශේෂයෙන් භාවිතා කිරීමට කටයුතු කරන ලෙසද කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටින අතර මීට පෙරද මේ සම්බන්ධව මෙම කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හා 2020.01.17 දිනැති චක්‍රලේඛය මගින් ද ඔබව දැනුවත් කර ඇත.

03 එලෙස නොවැළැක්විය හැකි හේතුවක් මත හැර, ලිත් මසක් ඇතුලත මෙම කාර්යාලයට වෙත යොමු නොකරන ස්ථිරව මුදාහැරීම්, තාවකාලික මුදාහැරීම්, ඉල්ලා අස්වීම් මින් ඉදිරියට කොමිෂන් සභාව විසින් අනුමත නොකරන බවද එසේ වන ප්‍රමාද වීම් සඳහා අදාළ නිලධාරීන් වගකිව යුතු බවද කොමිෂන් සභාව විසින් මා වෙත ලබා දී ඇති උපදෙස් අනුව වැඩිදුරටත් දන්වා සිටිමි.

පී.එස්.ආර්.එම්.විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පී.එස්.ආර්.එම්. විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
පළාත් සභා සංකීර්ණය-රත්නපුර